පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ජුනි 2 සතිය

විෂය - පෙරදිග සංගීතය

13 ශ්‍රේණිය

Prepared by : Mrs. D.M. Dilrukshi Premalal

**නිපුණතාවය 4.0 / නිපුණතා මට්ටම 4.1** **පාඩම - තබ්ලා වාදනයක අංග**

ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.

01. තබ්ලා වාදනයට පදනම් වූ කාලයේ අවනද්ධක්ෂර සමූහය හැඳින්වෙන නාමය වනුයේ,

1. කායදා 2. පල්ටා 3. ඨේකාව 4. ගත් 5. මුඛාඩා

02. කායදා පිළිබඳ නිවැරදි කියමන වනුයේ,
1. ආවර්ත 02 කට හෝ 03 කට සීමා වූ පද විශේෂයකි
2. ආවර්ත 01 කට පමණක් සීමා වූ පද විශේෂයකි
3. ආවර්ත 04 කට සීමා වූ පද විශේෂයකි
4. ආවර්ත 05 කට සීමා වූ පද විශේෂයකි
5. ආවර්ත 04 ක් හෝ ඊට වැඩි ගණනක් සහිත පද විශේෂයකි

03. අදාළ කායදාවට අනුව වර්ධනය කරන පද ප්‍රබද්ධය හඳුන්වන නාමයය වනුයේ,
1. පරන් 2. තිහායි 3. ලෙහෙරා 4. පල්ටා 5. චක්‍රදාර්

04. පල්ලාවක් ලෙස හඳුන්වනුයේ,
1. කයදාවට අයත් පද කොටසයි
2. වයනු ලබන තාල පදයේ අක්ෂර සමූහයයි
3. පල්ටාවට අයත් පද කොටසයි
4. වයනු ලබන තාලයට අනුව ස්වර වාද්‍ය භාණ්ඩයකින් වයනු ලබන නාද මාලාව
5. තිහායි සඳහා වාදනය කරන පද කොටසයි

05. නග්මා ලෙස හඳුන්වනුයේ,
1. කායදාව සඳහා භාවිතා කරන වෙනත් නාමයකි
2. පල්ටාව සඳහා භාවිතා කරන වෙනත් නාමයකි
3. ලෙහෙරාව සඳහා භාවිතා කරන වෙනත් නාමයකි
4. චක්‍රදාර් සඳහා භාවිතා කරන වෙනත් නාමයකි
5. තිහායි සඳහා භාවිතා කරන වෙනත් නාමයකි

II **කොටස**

- <u>පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.</u>

06. ඨේකාව යන්න උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න.

07. ත්‍රිතාලය අයත් ඨේකාව ලියා දක්වන්න.

08. ඔබ ඉහතින් දැක්වූ කායදාවට අයත් පල්ටාවක් ගොඩනගන්න.

09. තිහායි හා චක්‍රදාර් යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

10. ලෙහෙරා යන්න හඳුන්වා ලෙහෙරාවක් වාදනය සඳහා යොදා ගත හැකි භාණ්ඩ 3 ක් නම් කරන්න.